මගේ අංකය - JSC/SEC/CIR-L/2025

අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක - 06

දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරන මහාධිකරණ කලාපවලට අයත් සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් වෙත,

<u>**2023 අංක 09 දරණ දූෂණ විරෝධි පනතට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම**</u>

ශීර්ෂගත කරුණ හා සබැඳිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් රුවනි වික්‍රමසිංහ මහත්මිය/මෙනවිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද 2025.01.31 දිනැති අංක DG/CA/AD/144 දරණ ලිපිය පිලිබඳව සලකා බලන ලදුව, ඔබ මහාධිකරණ කලාපයට අයත් සියලු අධිකරණවල සේවයේ නියුතු අධිකරණ නිලධාරීන් නොවන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කල යුතු අනෙකුත් සියලු නිලධාරීන් පිලිබඳ තොරතුරු වාර්තාවක් (සංඛ්‍යාත්මකව) පහත සඳහන් ආකෘතිය ප්‍රකාරව සකසා කඩිනමින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලෙස ඔබට මෙයින් දන්වා සිටිමි.

02. තවද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් 2024.04.29 දිනැතිව නිකුත් කරන ලද අංක JSC/SEC/CIR-L/2024 දරණ චක්‍රලේඛ ලිපිය කෙරෙහිද ඔබගේ අවධානය යොමු කරමි.

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | වාර්ෂිකව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු ඔබ අධිකරණ කලාපයට අයත් සියලු අධිකරණවල සේවයේ නියුතු අධිකරණ නිලධාරීන් නොවන මුළු නිලධාරීන් සංඛ්‍යාව | |
| 02 | ඔබ අධිකරණ කලාපයට අයත් ඉහත 01 හි සඳහන් අධිකරණ නිලධාරීන් නොවන අනෙකුත් සියලු නිලධාරීන්අතරින් 2024 වර්ෂයට අදාලව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දී ඇති නිලධාරීන් සංඛ්‍යාව | |
| 03 | ඔබ අධිකරණ කලාපයට අයත් ඉහත 01 හි සඳහන් අධිකරණ නිලධාරීන් නොවන අනෙකුත් සියලු නිලධාරීන්අතරින් මේ වන විටත් 2024 වර්ෂය සඳහා සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති නිලධාරීන් සංඛ්‍යාව | |

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 මාර්තු මස 18 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.